www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# නිව් යෝක් ටයිම්ස් පත්‍රය රෝමන් පොලන්ස්කිව බිල්ලට දෙයි

## The New York Times throws Roman Polanski to the wolves

**ඩේවිඩ් වොල්ෂ් සහ ඩේවිඩ් නෝර්ත් විසිනි**

**2009 ඔක්තෝබර් 1**



**රෝමන් පොලන්ස්කි**

චිත්‍රපට අධ්‍යක්ෂ රෝමන් පොලන්ස්කිව ස්විට්සර්ලන්තයේ දී අත්අඩංගුවට ගැනීම සහ ඔහු වරදකරුවකු ලෙස එක්සත් ජනපදයට භාරදීමට පවතින තර්ජනය 'නීතිය හා සාමය' පිලිබඳව ගොරවන දඩ බල්ලන්ව කැඳවා ඇත. මෙවැනි අවස්ථාවක දී මානවීය සලකාබැලීම්වලට සහ සමාවදීමේ ධී ගුනයට පවා මහජන විඥානය මත බලපෑමක් ඇතිකල හැකිවේ යයි බියපත්වන එම බලවේග ආක්‍රමනශීලීව සහ පූර්වභංග ලෙස ප්‍රතිචාර දක්වති. අදාල සිද්ධියේ පුලුල් හේතූන් ගැන උනන්දුවක් නො දක්වා සමාජයේ යහපත පිනිස පොලන්ස්කිව සිර ගතකොට තබන මෙන් දැඩිව ඉල්ලා සිටින ගනන් නැති ප්‍රතිගාමී හඬවල් නැංවී ඇත.

මේවාට වාර්තාගත ලිබරල් පුවත්පත වන *නිව් යෝක් ටයිම්ස්හි* කර්තෘ මන්ඩලය ද දැන් අපට එකතු කල හැක. දේශපාලනිකව අර්ථභාරී ලිපියක කර්තෘවරු ක්‍රෝධයෙන් සහ ද්වේශයෙන් ලොස් ඇන්ජලීස්හි නීතිය බලාත්මක කරන නිලධාරීන් පැත්තේ බර තබා ඇත.

2009 සැප්තැම්බර් 30 දා පලකල "පොලන්ස්කි සිද්ධිය" නම් ලිපියක *ටයිම්ස්* පුවත්පත ප්‍රථමයෙන් ඔහුව රඳවා තැබීමට එරෙහි වීම සමච්චලයට ලක් කරයි. "ප්‍රන්සය, පෝලන්තය සහ අනෙකුත් යුරෝපීය ජාතිකයන්ගේ විරුද්ධත්වයන්ට ඇහුම් කන් දෙන ඔබ සිතා සිටිනවා විය හැක්කේ චිත්‍රපටකරුවා යම් ආඥාදායක තන්ත්‍රයට එරෙහිව සත්‍යය කතා කිරීම නිසා එමගින් ඔහුව අත්අඩංගුවට ගෙන ඇති බව ය."

ඉදින් මානව හිමිකම් උල්ලංඝනය කරනු ලැබීමේ හැකියාව පවත්නේ "ආඥාදායක තන්ත්‍රයන්" යටතේ පමනක් වන අතර ධනේශ්වර "ප්‍රජාතන්ත්‍රයන්" යටතේ එසේ නො වේ? ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් ආයතනය මේ වසරේ ප්‍රකාශ කල පරිදි "ත්‍රස්තවාදය මැඩීමේ නාමයෙන් ඇමරිකා එක්සත් ජනපදය ඉරාකයේ, ඇෆ්ගනිස්ථානයේ, ගුවන්තනාමෝ කඳවුරේ සහ තවත් තැන්වල පුද්ගලයන්ගේ හිමිකම් උල්ලංඝනය කොට තිබේ. 2001 සැප්තැම්බර් 11දා සිට ඇමරිකා එක්සත් ජනපදය විසින් සහ එය වෙනුවෙන් කරන ලද මානව හිමිකම් උල්ලංඝනය කිරීම් බොහොමයක් සහ විවිධ වේ." තව ද "එක්සත් ජනපද බන්ධනාගාර, හිරගෙවල් සහ සංක්‍රමනිකයන් රඳවා තබාගැනීමේ කඳවුරුවල පොලිස් කෲරත්වය සහ අකරුනාවන්තභාවය 2009 වසර තුල අනවරත වාර්තාවන් පවතී. පොලීසිය ටේසර්ස් (විද්‍යුත්-කම්පක ආයුධ) භාවිතා කිරීමෙන් පසු මිනිසුන් දුසිම් ගනනක් මරනයට පත්වූහ."

දේශපාලන ඉතිහාසය ඇතිතරම් අප්‍රතිපත්තික සහ මුදල් තකනසුලු වන ස්විස් අධිකාරීන්ට සැකයේ වාසිය දිගු කල යුතුවන්නේ ඇයි? සියල්ල තිබියේවා කුප්‍රකට මූල්‍ය වංචාකාර මාක් රිච් ඇමරිකානු නීතියෙන් පලාගියවිට ඔහුට ස්විස් ආන්ඩුව රැකවරන දුන්නේ ය.

ඇත්ත වසයෙන් ම එම සුවිශේෂී සිද්ධියට "සුඛාන්තයක්" තිබිනි. සිය ජනාධිපති ධුරකාලීය අවසන් හෝරා කිහිපයේ දී බිල් ක්ලින්ටන් විසින් ප්‍රදානය කරන ලද ජනාධිපති සමාවක වාසියේ හිමිකරුවෙක් බවට රිච් පත් විය. එවකට සහකාර නීතිපති වූ එරික් හෝල්ඩර් දෙනු ලැබූ නිර්දේශයකට අනුග්‍රාහී ලෙස ක්ලින්ටන්

ක්‍රියා කලේ ය. හෝල්ඩර් දැන් ඔබාමා පරිපාලනය යටතේ නීතිපති තනතුර දරයි. ඇත්ත වසයෙන් ම රිච් වනාහි පොලන්ස්කි නො වේ. ක්ලින්ටන්ට සහ ඩිමොක්‍රටික් පක්ෂයට කරන ලද සුවිසල් මූල්‍යාධාර සමගින් තම පව් සෝදාගැනීමේ ඉහල ඉවක් මූල්‍ය සම්පාදකයා සතු විය.

පොලන්ස්කිගේ අපරාධය සහ ආයාචනා සම්මුතිය ලුහුඬු ලෙස විමර්ශනය කිරීමෙන් පසු *ටයිම්ස්* පුවත් පත මෙසේ කියාගෙන යයි: "චිත්‍රපට අධ්‍යක්ෂවරයාට රට තුල සහ ඉන්පිටත දශක තුනක් තිස්සේ නිදහසේ සරන්නට ඉඩදීමෙන් පසු ස්විට්සර්ලන්තය දැන් ඔහුව අත්අඩංගුවට ගැනීමට තීරනය කිරීම යම් අපූර්වත්යක් දරයි. මාරිනා සෙනොවිච් විසින් 2008 වසරේ තනන ලද *රෝමන් පොලන්ස්කිː අවශ්‍යය යි, ප්‍රාර්ථනා කෙරේ* යන වාර්තා චිත්‍රපටයක් ප්‍රසිද්ධිය හඹායන කැලිෆෝනියාවේ විනිසුරු ලෝරන්ස් රිටන්බෑන්ඩ් නඩුව මෙහෙයවූ අරුම පුදුම ආකාරය පිලිබඳව සමහර අපහසුවට පත්කරන සුලු ගැටලු ඉස්මතු කලේ ය."

ස්විට්සර්ලන්තය තුල නිවසක් හිමි වූ ද පෙනෙන පරිදි ගිම්හාන කාලයෙන් වැඩිකොටසක් එම නිවසේ ගතකර ඇත්තා වූ ද පොලන්ස්කි එම රටේ රඳවා ගැනීමට ගත් ක්ෂනික තීරනය *ටයිම්ස්* කතුවරුන් හොඳින් ම දන්නා පරිදි "අපූර්වත්වයට" වඩා බෙහෙවින් දුරදිග යයි. දැවැන්ත ස්විස් බැංකුවක් වන යූබීඑස් බැංකුව සම්බන්ධ බදු පැහැරහැරීමේ අපචාරයක පීඩනය යටතේ පසුවන්නා වූ ද අන්තිම ෆ්‍රෑන්කුව සහ ඉන් සියයෙන් පංගුව දක්වා ම බැංකුවල ලාභය පිලිබඳ නො සලකා කිසිදු විදෙස් පිලිවෙත් තීන්දුවක් නො ගන්නා වූ ද ස්විස් අධිකාරීහු තමන්ගේ සකල මූල්‍ය ආයතනයන් ආරක්ෂා කරගැනීම සඳහා දරන නරුම ප්‍රයත්නයේ කොටසක් ලෙස චිත්‍රපටකරුවා අල්ලාගැනීම මගින් එක්සත් ජනපදයට කටුවක් විසි කලහ.

"ප්‍රසිද්ධිය පසුපස යන විනිසුරුවෙක්" මූලික විභාගය මෙහෙයවූ ආකාරය පිලිබඳව වැඩිදුර කිසිවක් නො කියන *ටයිම්ස්* පුවත්පත පුදුම සහගත ලෙස "කරදරකාරී ගැටලු" නො තකා හරී. 1970 ගනන් අගභාගයේ නඩුව පැවැත්වූ ආකාරය තුල "සැලකිය යුතු අපචාරී බවක්" තිබුනු බව මේ වසරේ මුල්කාලයේ දී ලොස් ඇන්ජලීස්හි උපරිමාධිකරන විනිසුරුවෙක් පිලිගත්තේ ය. වසර 30කට පසුව පොලන්ස්කිව ලුහුබැඳ චෝදනා ගොනුකල යුතු ද නැද්ද යන්න මත මෙය යම් නෛතික හා සදාචාරාත්මක සම්බන්ධයක් නැති ද? වෙනත් ආකාරයකින් නෛතික විස්තරයනට කැපකරනු ලද හැකි කතුවැකිය මෙහි භව්‍යතාව පිලිබඳව උනන්දුවක් නො දක්වයි.

පරිපූර්න නරුමත්වයෙන් යුතුව *ටයිම්ස්* මෙසේ කියාගෙන යයි: "ව්‍යවස්ථානුකූල දූෂනයට වරද පිලිගෙන පරාජය පිලිගන්නා පුද්ගලයෙක් ඔහු කොතරම් දක්ෂ වුවත් නීතිය ඉදිරියට ගෙන ඒමේ අසාධාරනය කුමක් ද?"

"නීතිය ඉදිරියට ගෙනඒම" යන්නෙන් *ටයිම්ස්* අර්ථ දක්වන්නේ යන්තම් දශකයකට පෙර අනුකම්පා විරහිතව මයිකල් ජැක්සන්ව ලුහුබැඳ ඔහුගේ ජීවිතය කීතුකොට දමා ඔහුගේ අකල් මරනයට දායකත්වය දැක්වූ චෝදකයින් සිටින ලොස් ඇන්ජලිස් වෙත 76 වියැති පුද්ගලයෙකු භාරදීම යි.

"ලොස් ඇන්ජලිස්" සහ "සාධාරනය" යන වචන එකම වාක්‍යයට අයත් වචන නො වේ. පොලන්ස්කි එක්සත් ජනපදයෙන් පලාගියේ දූෂනය සහ ක්‍රමානුකූල පොලිස් ප්‍රචන්ඩත්වය, වර්ගවාදය සහ බොරු නඩු පිලිබඳව කුප්‍රකට ද්වේශ සහගත ලොස් ඇන්ජලිස් අධිකාරීන් කෙරෙහි වූ සාධාරන බියකිනි. තම පිටුවහල් කාලය තුල සම්මානලාභී ද පියැනිස්ට් ඇතුලු වෘතාන්ත චිත්‍රපට දහයක් තැනූ චිත්‍රපටකරුවා සිටයේ සැඟවීගෙන නො වේ.

තම සකලාකාර පිලිස්තීනුමය ස්වයං-තෘප්තභාවය කැඳවා ගන්නා ඇමරිකානු ලිබරල්වාදයේ නායක හඬ මෙසේ සමාප්ත කරයි ''(පොලන්ස්කිගේ ආධාරකරුවන් සමග) ශක්තිමත් ලෙස නො එකඟ වන අපි මෙම නඩුවට පොලන්ස්කි මහතාගේ වැඩකටයුතු හෝ වයස සමග මොන ම සම්බන්ධයක්වත් නැතැයි පෙන්වාදීමට අනෙකුත් ප්‍රමුඛ යුරෝපීයයන් පටන්ගෙන තිබීම ගැන සන්තෘෂ්ටියට පත්වන්නෙමු. එය වනාහි වැඩිහිටියෙකේ කුඩා ලමයෙක්ව බිල්ලට ගැනීම පිලිබඳ සිද්ධියකි. පොලන්ස්කි මහතා එයට වරද පිලිගෙන ඇති අතර එයට දඬුවම් විඳිය යුතු ය."

මොන තරම් පිලිකුල් සහගත ද! මෙවැනි සිදුවීමක් පිලිබඳව මේ ආකාරයෙන් අදහස් දැක්වීමට තමන්ගේ මාවතෙන් පිටපැනීමට *ටයිම්ස්* පුවත්පතට සිදුවීම දේශපාලන අර්ථභාරයක් දරා සිටී. එය වනාහි අන්ත දක්ෂිනාංශයට, "පවුල් වටිනාකම්වලට" දරදිය අදින්නන්ට සහ අනෙකුත් නින්දිත සමාජ අවයවයන්ට දෙන ලද ගනන් බැලූ සහනයකි. ඊට ම ගැලපෙන ලෙස අන්ත දක්ෂිනංශික විචාරක නොයෙල් ෂෙපර්ඩ් පුවත්පතේ ආස්ථානය සමග සිය සතුට පල කලේ ය ( "මේ ගතානුගතික මාධ්‍ය විශ්ලේෂකයාගෙන් ඔබට නිතර අසන්නට නො ලැබෙන යමකි: බ්‍රාවෝ, එන්වයිටී බ්‍රාවෝ).

තව ද තම ආස්ථානයට බරක් තිබෙන බව *ටයිම්ස්* කතුවරු දනිති. පොලන්ස්කිට එරෙහි වාතාවරනයට තවදුර විෂ එක්කිරීමටත් අධිකාරීනට එරෙහිව තමන්ට ආරක්ෂාවීමට තිබෙන හැකියාවට වලකැපීමටත් කතුවැකිය ආධාර වේ. තම ප්‍රතිගාමී විච්ඡේදකයන් සමග එක දවසකට හෝ පයුරුපාසනයේ යෙදීමට

හැකිනම් පොලන්ස්කිව බිල්ලට දීමට *ටයිම්ස්* ඕනෑවටත් වඩා කැමති ය.

වර්තමානයේ ඇමරිකානු ලිබරල්වාදය මුලුමනින් ම ප්‍රතිපත්ති හා සදාචාර විරහිත ය. මානවීයත්වය ගනනට නො ගත්තත් මෙම දුක්ඛිත ප්‍රතිපත්ති බාදනය හුදු ඇමරිකානු ප්‍රපංචයක් නො වේ. යුරෝපය තුල ද මුල දී පොලන්ස්කිගේ ඉරනමට අනුග්‍රහශීලී වූ මහජන මතය ඔහුට එරෙහි බවට හැරවීම සඳහා සාමූහික උද්ඝෝෂනයක් දියත් කෙරී පවතී. එහි ද ප්‍රමුඛ භූමිකාව ඉටුකරනු ලබන්නේ නිල "වාමාංශයේ" නියෝජිතයන් විසිනි.

ප්‍රමුඛ යුරෝපීය හරිත දේශපාලනඥ ඩැනියෙල් කෝන්-බෙන්ඩිට් පොලන්ස්කිව අත්අඩංගුවට ගැනීම පිලිබඳව කෝපය පලකල ප්‍රන්ස ඇමතිවරුන්ට දොස්නැගීමේ දී ෆැසිස්ට්වාදී ල පෙන් සමග පොදු මාවතක් ගෙන ඇත. 1968 යලි මතකයට නගා ගතහොත් කෝන්-බෙන්ඩිට් යනු කුප්‍රකට "රතු ඩැනී" ය. පසුගිය වසර 40න් වැඩිකාලයක් ඔහු ගතකොට ඇත්තේ සිය තරුනකාලයේ අතිරික්තයන්ට වන්දි ගෙවීමට පැරනි ප්‍රන්ස ආප්තවාක්‍යයක් වන "30ට පෙර විප්ලවවාදියෙකි, ඉන්පසුව ගොපල්ලෙකි" යන්නෙහි නො නස්නා සත්‍යතාවය ඔප්පු කරමිනි.

*ටයිම්ස්* සහ ප්‍රධාන ධාරාවේ අනෙකුත් මාධ්‍ය සාධාරනය ඉටු කරනු ලැබිය යුතු යයි හඬ තලති. ඔවුන්ගේ නරුමත්වය සීමා මායිම් හඳුනන්නේ නැත. "රට ඉදිරියට ගමන් කල යුතු යයි" ද නීතිවිරෝධීව රඳවාගෙන සිටින්නන්ව ලිංගික අපහරනයට, වධබන්ධනවලට ලක්කෙරෙන සහ සමහර අවස්ථාවල දී ඝාතනයට ලක්කෙරෙන ගුවන්තනාමෝ, අබුග්‍රයිබ්, බාග්‍රෑම් සහ ලෝකය පුරා පිහිටි "කලු භූමිවල" ගෝලීය ජාලය පැවැත්වූ හා දිගට ම පවත්වාගෙන යන සීඅයිඒහි සහ මිලිටරියේ අපරාධකරුවන් ඔවුන්ගේ සාහසික ක්‍රියා සම්බන්ධයෙන් දඬුවම් නො ලබා සිටිය යුතු යයි ද යන්න පිලිබඳව සමස්ත ඇමරිකානු සංස්ථාපිතය ම එක හඬින් එකඟ වෙති.

ඉතා ම අවම තක්සේරුවකට අනුව පවා 2003 වර්ෂයේ පටන් ඉරාක වැසියන් සිය දහස් ගනනකගේ ජීවිත බිලිගෙන ඇති අවිචාරවත් ආක්‍රමනකාරී යුද්ධයක් දියත් කල ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ්, ඩික් චේනි, ඩොනල්ඩ් රම්ස්ෆෙල්ඩ් ඇතුලු පිරිස විවිධ දේශපාලනික අපරාධකාරී ක්‍රියා වෙනුවෙන් කල කතාවලට මුදල් කන්දරාවල් එකතු කරමින් නිදහස් මිනිසුන් ලෙස වෙසෙති. තම දෑත්වලින් ලේ වැගිරෙන මිනිසුන් ඔවුහු ය. *ටයිම්ස්* පත්‍රය කවරකලෙකවත් ඔවුන්ව අත්අඩංගුවට ගෙන චෝදනා පමුනුවන ලෙස කැඳවුම් කර නැත.

පොලන්ස්කි වෙත පලවන කිසිදු අනුග්‍රහශීලීත්වයක් අපකීර්තියට පත්කිරීමට හා නීති-විරෝධී යයි පැවසීමට උත්සාහ දරමින් *ටයිම්ස්* සහ දක්ෂිනාංශික කල්ලිය අඟවා සිටින්නේ ඔහුව හදිසියේ අල්ලාගෙන හිරගතකිරීමට දක්වන විරුද්ධත්වය ඔහු 1977 වසරේ දී 13 වියැත්තෙක්ව ලිංගික පීඩාවට ලක්කිරීම කෙරෙහි උදාසීනත්වයක් අඟවා සිටින බව ය. 1977 වසරේ සිද්ධිය අපරාධයකි. එහෙත් මෙම ඛේදවාචී සිද්ධිය මත පදනම්ව පොලන්ස්කිගේ පෞරුෂත්වය සහ සමස්ත ජීවිතය ම නිශ්චය කලහැකි යයි අප විශ්වාස කරන්නේ නැත. අප මෙම අදහස දරන්නේ නිශ්චිතව ම පොලන්ස්කි හුදෙක් වැදගත් කලාකරුවෙක් නිසා (ඔහුගේ ප්‍රතිගාමී චෝදකයන් දැන් අනවන ආකාරයට මෙම කරුනත් නො වැදගත් නො වේ යයි ප්‍රකාශ කිරීමට අප අකැමති නො වන අතර ම) පමනක් නො වේ. දැනට ඇමරිකානු බන්ධනාගාරවල කාලය කා දමන මනුෂ්‍යයන් මිලියන දෙකක් අතුරින් "සහජ" දුශ්චරිතයට වඩා සමාජ සහ පාරිසරික සිද්ධීන් සමග සම්බන්ධ හේතු ඇත්තවුන් කොපමන ඇද්ද?

ඇත්ත වසයෙන් ම රෝමන් පොලන්ස්කි ඉතා ධනවත් පුද්ගලයෙකි. එහෙත් වර්තමාන සදාචාරවාදී රොත්ත කරන ආකාරයට ඔහුගේ ක්‍රියාවට ඔහුගේ කම්පාකාරී ජීවිතයේ අනෙකුත් දේවල් සමග "මොන ම සම්බන්ධයක් නැතැ යි" තර්ක කිරීම මුග්ධ ය.

ඔහුගේ මුල්කාලීන ජීවිතය පිලිබඳව පවතින තතු විස්තරාතමකව තරමක් වෙනස් වෙතත් ඒ සියල්ල එය ඉතා ඛේදවාචී චරිතයක් බව පෙන්නුම් කරයි. 1933 වසරේ පැරිසියේ දී යුදෙව් පියෙකුට සහ රෝමානු කතෝලික මවකට දාව උපන් පොලන්ස්කි වයස අවුරුදු තුනේ දී පෝලන්තයේ ක්‍රාකොව් වෙත තම පවුල සමග පදිංචියට ගියේ ය. *ගාඩියන්*හි 2005 වසරේ පලවූ වාර්තාවක් මෙසේ කියයි: "ජර්මානුවෝ ආක්‍රමනය කරන විට පොලන්ස්කි පවුල යුදෙව් පෙදෙසේ සිරගතව සිටි අතර 1943 දී නාසීහු සිවිල් වැසියන්ට පිටවන ලෙස නියෝග කලහ. කටුකම්බි වැටේ විවරයක් කැපීමට සමත් වූ ඔහුගේ පියා බියපත්ව සිටි රෝමන්ට ඔහුව බලාගැනීම සඳහා මුදල් ගෙවා තිබූ පවුලක් වෙත පලායන ලෙස කීවේ ය. එස්එස් නිලධාරීහු යුදෙව් මිනිසුන්ට පෙලගැසීමට අනකරද්දී ස් හඬ නැගූ ඔහු හඬමින් සිටි දරුවාට 'පලයං!' යයි කීවේ ය. කිසිවිටෙක පසුපස නො බැලූ රෝමන් දිව ගියේ ය.

"පසුව ඔහු දැනගත්තේ (අවුෂ්විට්ස් හි) ගෑස් කාමරවල දී ඔහුගේ මව ඝාතනයට ලක්ව ඇතත් ගල් වැඩපලක වහල් ශ්‍රමය වැගිරීමට බලකෙරුන ද ඔහුගේ පියා නො නැසී ජීවත් වූ බව ය. යන්තමින් පන ගැටගසා ගනිමින් මිතුරන් සහ අමුත්තන්ගේ අතින් අතට යමින් ඔහු ගම්මානවල නිදැල්ලේ ගියේ ය."

නව යෞවනයෙක් ලෙස ඔහුගේ ජීවිතය පිලිබඳව අදහස් දැක්වූ (2005 වර්ෂයේ දී ම) *ඉන්ඩිපෙන්ඩන්ට්* පුවත්පත මෙසේ කීවේ ය: "පොලන්ස්කි, ඔහුගේ කෙටි

චිත්‍රපට ඔහු අනාගත දක්ෂයෙකු වන බව ක්ෂනිකව වෙන් කොට දැක්වූ කීර්තිමත් ලොඩ්ස් චිත්‍රපට පාසලේ ස්ථානයක් දිනාගත්තේ ය. අතරමැද කාලපරිච්ඡේදයේ ඒ වනවිටත් මිනිසුන් තිදෙනෙක් මරාදමා තිබූ මිනිසෙක් අතින් මැරුම්කෑමෙන් ඔහු යන්තමින් බේරුනේ ය. ජීවිතය ඔහුට මොනතරම් කම්පනයන් ගෙනදුන්නත් පොලන්ස්කි ජානමය වසයෙන් නො නැසී පැවැත්මට පෙර සකසනු ලැබ තිබූ බව පැහැදිලි ය.

"එහෙත් ඔහුගේ සමීපතමයන් සම්බන්ධයෙන් එය හැමවිට ම සත්‍ය නො වේ. 1969 දී ඔහුගේ දෙවන බිරිය වූ ෂැරොන් ටේට්ව තවත් මිතුරන් හතර දෙනෙක් ද සමගින් චාල්ස් මැන්සන් සහ ඔහුගේ අනුගාමිකයින් විසින් සංහාරයට ලක්කරන ලදී. භීතිය වැඩිකරලූයේ ටේට් ඔවුන්ගේ ප්‍රථම දරුවා සමගින් අටමස් ගැබිනියකව සිටි බවයි. ඔහුගේ නිෂ්පාදන සැලසුම්කරුවා (*ඔන් මැක්බෙත්හි*) ඔහු වේදිකා උපකරන මත ඕනෑවට වැඩියෙන් ලේ භාවිතා කරන බවට පැමිනිලි කලවිට පොලන්ස්කි දුන්නේ 'මම ප්‍රචන්ඩත්වය දන්නවා. තමුසෙට තිබුනෙ පහුගිය ගිම්හානෙදි මගේ ගේ දකින්න'" යනුවෙනි.

ඔහුගේ චිත්‍රපට තුල විශාල පිළිබිඹුවක් අත්පත් කරගන්නා එවැනි ඛේදජනක අත්දැකීම් පොලන්ස්කිට එරෙහිව චෝදනා නැගී ඔහු වරද පිලිගෙන ඇති අපරාධයට මුලුමනින් ම අසම්බන්ධ වන්නේ කෙසේ ද? මෙම කාලසීමාවේ ඔහුව සිරගත කිරීම සේවය කරන්නේ කවරකට ද? ඔහු සමාජයට දක්වන අනතුර කුමක් ද?

මතුපිටින් ලිබරල් තවත් කුලුනක් වන *ලොස් ඇන්ජලීස් ටයිම්ස්* පුවත්පත ගොදුරු බවට පැමිනි තැනැත්තාගේ මූලික ප්‍රධාන ජූරි සාක්ෂියේ වඩාත් ම බියජනක තොරතුරු අඩංගු ස්ටීව් ලෝපෙස් විසින් ලියන ලද (පොලන්ස්කිගේ ආධාරකරුවෝ සැබෑ ගොදුර නො දකී) අතිශය පිලිකුල් සහගත ලිපියක් පලකලේ ය. මෙය වනාහි සාධාරනය ඉටුවීම දැකගැනීමේ නාමයෙන් දක්ෂිනාංශක මෝලට සපයාදුන් කාමෝද්දීපික ධාන්‍යයකි. ලෝපෙස් වනාහි මහජනයාගේ පහත් ම හැඟීම්වලට ආමන්ත්‍රනය කිරීමට ලැබෙන සියලු අවස්ථාවන් සාදරයෙන් පිලිගන්නා ඇමරිකානු මාධ්‍යයේ තවත් තකතීරුවෙකි.

පොලන්ස්කිගේ අපරාධයේ ගොදුර වන දැනට 44 වියැති සමන්තා ගයිමර් මෙවැනි පිලිවෙතක් ගෙනයාම සම්බන්ධව මාධ්‍ය හෙලාදැක ඇත. පොලන්ස්කිගේ විරෝධතාකරුවන්ට වඩා සුවිසල් මානුෂීයත්වයක් ඇය පෙන්නුම් කොට ඇත්තේ 2003 දී පලකල සමකතුවැකියක මෙසේ ලියමිනි. "ඔහු ආපසු ආ යුතු ද? ඔහු පලායන්නෙක් නො වී නිදහසේ ඇවිදිය හැකි පුද්ගලයෙකු වීම මා සිතා ගත යුතුව ඇත. පුද්ගලිකව එය එලෙස වනු දැකීමට මම කැමැත්තෙමි. ඔහුට පලායාමට බලකල තත්ත්වයට ඔහුව කිසිදා පත් නො කල යුතු ය. අප සියලු දෙනා එකඟ වුනු පරිදි වසර 25කට පෙර ඔහුට ගැලපෙන කාලසීමාවක දඬුවමක් ඔහුට ලැබිය යුතුව තිබුනි. ඒ අවස්ථාවේ දී මගේ නීතිඥයා වූ ලෝරන්ස් සිල්වර් විනිසුරුවරයාට ලියා දැන්වූයේ වරද පිලිගැනීම පිලිගත යුතු බවත් එසේ වරද පිලිගැනීම අපව තෘප්තිමත් කිරීමට ප්‍රමානවත් බවත් ය. මම මගේ අදහස වෙනස් කරගෙන නැත්තෙමි."

76 වියැති පුදගලයෙක් මෙන් ම අත්‍යසාමාන්‍ය කලාකරුවෙක් එක්සත් ජනපදයට සහ නො වැලැක්විය හැකි මාධ්‍ය කවයට බාරදීම වඩාත් බියජනක විපාක ඇතිකල හැකිය යන්න ගැන *ටයිම්ස්* හි තැකීමක් නැත. නරක ම දෙය සිදුවුවහොත් කතුවරු වගකීම බෙදාහදා ගත යුතු ය.

© www.wsws.org